**ශීර්ෂය 020 - මැතිවරණ කොමිෂන් සභාව**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 020 -මැතිවරණ කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 12 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මැතිවරණ කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණය අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | මෙම වාර්තාවේ ඡේදයට යොමුව |
|---|---|
| ඉකුත් වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශනයන්හි ශේෂයන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් සමඟ සැසඳීමේදී වෙනස්කම් පැවතීම. | 1.6.1 (ආ) (i) |

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) ආදායම් නොවන ලැබීම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දැක්විය යුතු රු.4,132,893 ක්වූ සේවක ණය පොළී, ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණි. | 2023 වර්ෂයේ අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | අදාල ආකෘතියට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |
| (ii) | ආදායම් නොවන ලැබීම් රු.28,531,110 ක් ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර ලැබීම් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. | 2023 වර්ෂයේ අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | අදාල ආකෘතියට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල අවසන් ශේෂයන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් සමඟ සැසඳීමේදී නොනිම් ගොඩනැගිලි ශේෂය රු.මිලියන 05 ක් අඩුවෙන්ද, වාහන ශේෂය රු.මිලියන 58.33 ක් වැඩියෙන්ද, වෙනත් යන්ත්‍ර සූත්‍ර උපකරණ ශේෂය රු.මිලියන 10.26 ක් අඩුවෙන්ද දක්වා තිබුණි. | 2021 වර්ෂයේ දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ස්ථාවර වත්කම් උඩුගත (Upload)කිරීමේදී සිදු වූ දෝෂයක් නිසා නොනිම් ගොඩනැගිලි ශේෂය රුපියල් මිලියන 5 කින් වැඩිවී ඇති අතර, වාහන ශේෂය රුපියල් මිලියන 58.33 ක් අඩුවෙන් හා යන්ත්‍ර සූත්‍ර උපකරණ රුපියල් මිලියන 10.26 කින් වැඩිවීමක් පෙන්නුම් කර ඇත. එම වරද 2022 වර්ෂයේ නිවැරදි කිරීම නිසා ආරම්භක ශේෂය වෙනස් වී ඇත. | ඉකුත් වර්ෂයේ අවසාන ශේෂ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස දක්වා අදාල ගැලපීම් වෙනම දැක්විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | 2021 වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගෙන තිබූ පිරිවැය රු.6,717,017 ක්වූ වත්කම් 2022 වර්ෂයේදී අපහරණය කර තිබුණද එම වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | අපහරණය කරන ලද භාණ්ඩ ඉවත් කිරීම සඳහා Asset List හි සලකුණු කර ලබාගැනීමට කටයුතු කරමින් පවතින බැවින් එමකාර්යය අවසන් වූ වහාම CIGAS වැඩසටහනින් ඉවත් කිරීමට කටයුතු කරමි. | අපහරණය කර තිබූ වත්කම්වල පිරිවැය ගිණුම්වලින් ඉවත් කළ යුතු වීම. |
| (iii) | තක්සේරු වටිනාකම රු.255,459,809 ක්වූ ගොඩනැගිලි 3 ක් හා ඉඩම් 2 ක් ගිණුම්ගත කර නොතිබුණි. | අදාළ ගොඩනැගිලිවල හා ඉඩම්වල වටිනාකම් වෙන වෙනම ලැබී නොතිබූ හෙයින් CIGAS පරිගණක පද්ධතිය හරහා ගිණුම්ගත කිරීමට නොහැකි විය. | වත්කම් නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම. |
| (iv) | රු.3,118,000 කට තක්සේරු කර තිබූ ගොඩනැගිලි 2 ක් රු.3,700,000 ක් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.582,000 කින් වැඩියෙන් දැක්විණි. | 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | වත්කම් නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම. |
| (v) | කොමිෂන් සභාවට අයත් නොවූ එකතු වටිනාකම රු.40,950,000 ක්වූ ගොඩනැගිලි 2 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | CIGAS දත්ත පද්ධතියෙන් ඉවත් කිරීම සඳහා අදාල ගොඩනැගිලිවල හා ඉඩම්වල වටිනාකම් වෙන වෙනම ලැබී නොතිබූ හෙයින් අදාළ තොරතුරු ලබාදෙන ලෙස දන්වා ඇත. | අදාළ වටිනාකම් ඉවත් කර ගිණුම් නිවැරදි කළ යුතු වීම. |

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| රජයේ නිලධාරීන්ට අත්තිකාරම් බී ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂයරු.100,974,010 ක් වුවත් 2022 මූල්‍ය ප්‍රකාශනයේ ඒසීඒ 5 ආකෘතියෙහි ආරම්භක ශේෂය ලෙස රු.101,108,337 ක් දක්වා තිබුණි. | 2021 වර්ෂය තුළ නිරවුල් කර තිබූ රු.134,327.00 ක ණය ශේෂය එම වර්ෂය තුලම කොමිෂන් සභාවට හර කර තිබුණද එය හඳුනා නොගැනීම නිසා 2021 මූල්‍ය ප්‍රකාශවල එම ශේෂය පෙන්නුම් නොකරයි. මෙය නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන 2023වර්ෂයේ යෙදීමට කටයුතු කර ඇත. | ආරම්භක ශේෂය නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් එක් පුනරාවර්තන වැය විෂයයක හා මූලධන වැය විෂයයන් 02 ක පිළිවෙලින් රු.288,601ක් හා රු.20,319,312 ක් ඉතිරිවීම් පැවතුණි. එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 48 සිට සියයට 100 දක්වා පරාසයක විය. | ආහාර හා නිල ඇඳුම් වැය විෂයය යටතේ ආහාර පාන සඳහා වියදම් ගිණුම්ගත නොකරන නිසා ප්‍රතිපාදන ඉතිරි විය. 2022 වර්ෂයේ කාර්තු පදනමට ප්‍රතිපාදන බෙදා වියදම් දැරීම නිසා 1303 වැය විෂයයේ මුල් කාර්තු තුනේ ප්‍රතිපාදන ඉතිරිවී ඇත. 2002 හා 2105 වැය විෂයයන් වලට අදාල වියදම් පැන නොනැඟුනු නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | වියදම් ඇස්තමේන්තු නිවරුදිව පිළියෙල කළ යුතු වීම. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 06 කට අදාලව ප්‍රතිපාදන ඉතිරිය රු.2,300,891 ක් හා එවායේ බැරකම් රු.82,051,967 ක් වීම නිසා ඉතිරිය ඉක්මවීම රු.79,751,076 ක් විය. | 1409, 1301 හා 1402 වැය විෂයයන් සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන වලින් පිළිවෙලින් රු.43,000,000 ක්, රු.3,000,000 ක් හා රු.1,000,000 ක ප්‍රතිපාදන කපාහැරීම කර ඇත. මු.රෙ. 66 මාරු කිරීම් යටතේ වෙනත් වැය විෂයයන්වලින් රු.8,300,000 ක ප්‍රතිපාදන මාරු කර ගැනීම කර ඇත. ඒ අනුව මෙම වැය විෂයයන්වල ඉතිරිය ඉක්මවා ඇත. | ප්‍රතිපාදන නොඉක්මවා බැරකම්වලට එළඹිය යුතු වීම. |
| (ii) | වැය විෂයයන් 07 කට අදාලව එකතුව රු.63,132,679 ක්වූ බැරකම්,ඇමුණුම iii බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | CIGAS වැඩසටහනට බැරකම් ඇතුළත් කළ හැකි වන්නේ එම වැඩසටහනේ ප්‍රතිපාදන ඉතිරියක් පෙන්නුම් කරන්නේ නම් පමණි. එම නිසා ඉහත බැරකම් වටිනාකම එහි ඇතුලත් වී නොමැත. | වැය ශීර්ෂයට අදාල සියළුම බැරකම් නිවැරදිව ගිණුම්වල දැක්විය යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **බැනර් මිලදී ගැනීම** | | |
| | 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඡන්ද හිමියන්ගේ දිනය සැමරීමේ කාර්ය ඇතුළත්ව තිබුණු බැවින් එම වැඩසටහන පූර්ව සූදානමකින් සැලසුම් කරගතහැකිව තිබියදී ඒ සඳහා අවශ්‍ය බැනර් 730 ක් සකස් කර ගැනීම හදිසි අවශ්‍යතාවයක් සේ සලකා වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කර ප්‍රසම්පාදන කටයුතු සිදු කර තිබුණු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ඡේදයට පටහැනිව ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලබාදිය යුතු දින 07 ක අවම කාලසීමාව වෙනුවට සැපයුම්කරුවන්ට ඒ සඳහා දින 02 ක් පමණක් ලබාදී තිබුණි. | ඡන්දහිමියන්ගේ දිනය පිළිබඳව පැවති නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහනේදී අදාල බැනර් දිස්ත්‍රික් කාර්යාල වෙත භාරදීම තුළින් ප්‍රවාහන වියදම් අවම කරගත හැකි බවට තීරණය වූ බැවින් එදිනට පෙර බැනර් මුද්‍රණය අවසන් කර කාර්යාලය වෙත ලබා ගැනීමට සැලසුම් කරන ලදි.මේ අනුව රජයට අවම පිරිවැයක් දැරීමට හැකිවන පරිදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ඡේදයේ අවසානයේ සඳහන්වන හදිසි ප්‍රසම්පාදනය සඳහා ඉහත සඳහන් කාලසීමාවන් අඩුකල හැකිය යන කරුණ ප්‍රකාරව සැපයුම්කරුවන්ට ලබාදී ඇති දින ගණන 02 දක්වා අඩුකරන ලදි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | **දත්ත මධ්‍යස්ථානය සඳහා අමතර විදුලි ජනන යන්ත්‍රයක් මිලදී ගැනීම** | | |
| (i) | මෙම ප්‍රසම්පාදනය සඳහා 2022 අප්‍රේල් 22 දින සැපයුම්කරුවන් 08 ගෙන් මිල කැඳවීම් කර තිබුණු අතර ප්‍රසම්පාදන අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසාන දිනය මැයි 13 ලෙස දක්වා තිබුණි. විගණනයට ඉදිරිපත් කළ ලිපිගොනුව අනුව පසුව එම දිනය 2022 මැයි 20 දින දක්වා පමණක් දීර්ග කර තිබුණු අතර එය සැපයුම්කරුවන් වෙත දන්වා තිබුණේ මිල ගණන් ඉදිරිපත් කළ | ප්‍රසම්පාදන අයදුම්පත් ඉදිරිපත් කලයුතු අවසන් දිනය මැයි මස 13 දින වුවත් රටේ පැවති අයහපත් තත්ත්වය හේතුවෙන් එදිනට කිසිදු මිල ගණනක් ඉදිරිපත් නොවේය. ඒ අනුව අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2022.05.20 ලෙස සංශෝධනය කර ඒ බව සියලුම සැපයුම්කරුවන් වෙත 2022.05.18 වන දින නැවතත් දැනුම් දුන් අතර ප්‍රමාණවත් | ප්‍රසම්පාදන අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසාන දිනය සංශෝධනය කිරීම ප්‍රමාණවත් කාලයක් තුළ සැපයුම්කරුවන්ට දැන්විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | යුතු අවසාන දිනට දින 02 කට පෙර එනම් 2022 මැයි 18 දිනදීය. | කාලයක් නොමැති බව හැඟීගිය බැවින් නැවතත් ලංසු විවෘත කිරීමේ දිනය 2022.05.23 ලෙස සංශෝධනය කර සැපයුම්කරුවන් වෙත දැනුම් දී ඇත. | |
| (ii) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.2 වගන්තිය ප්‍රකාරව ලංසු කැඳවීමේ ලේඛණවල සඳහන් වේලාවේදී ලංසු ලබා ගැනීම අවසන් කරනු ලැබිය යුතු අතර ප්‍රමාදව ලැබෙන ලංසු භාර නොගත යුතු බව සඳහන්ව තිබුණද විගණනයට ඉදිරිපත් කළ ලිපිගොනුව අනුව මෙම කොන්ත්‍රාත්තුව සඳහා මිල කැඳවීම භාරගන්නා අවසන් දිනය 2022 මැයි 20 වන දින වුවත් තෝරාගත් සැපයුම්කරු මිල ගණන් ඉදිරිපත් කර තිබුණේ 2022 මැයි 21 දිනදීය. | මෙම ලංසුවේ මිල ගණන් භාරගන්නා අවසන් දිනය 2022.05.20 දින වුවත් පසුව නැවතත් භාර ගන්නා දිනය 2022.05.23 ලෙස සංශෝධනය කර ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.2 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (iii) | විදුලි ජනන යන්ත්‍රය අදාල පිරිවිතරයන්ට අනුකූල වන බවට විදුලි ඉංජිනේරුවරයාගෙන් තහවුරු කිරීමක් ලබා නොගෙන රු.6,912,420 ක්වූ බදු රහිත වටිනාකමින් රු.4,767,000 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 30 දින චෙක්පතක් ලියා රඳවාගෙන තිබුණි. | මෙහි සඳහන් රු.4,767,000.00ක චෙක්පත 2022.12.30 දිනට ලියා තිබුණ ද එම චෙක්පත අදාල ආයතනය වෙත නිකුත් කරනු ලැබුයේ අදාල විදුලි ජනක යන්ත්‍රයේ සම්බන්ධතාවය දත්ත මධ්‍යස්ථානය වෙත ලබාදී සැපයුම් නිසි පරිදි සිදුවන බවට තහවුරු කර ගැනීමෙන් අනතුරුව වේ. | අදාල පිරිවිතරයන්ට අනුකූල බවට තහවුරු කර ගැනීමෙන් පසුව ගෙවීම් කළ යුතු බව සහ රජයේ මුදල් නිසි අනුමැතියකින් තොරව රඳවා නොගත යුතු වීම. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව මේ සඳහා වෙන් කර තිබූ මුදල රු.2,500,000 ක් වුවද එහි සත්‍ය වටිනාකම වූ රු.6,912,420 ඇස්තමේන්තුගත මුදලට වඩා සියයට 176 කින් වැඩිවී තිබුණු අතර ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කර නොතිබුණි. | ඩොලරයේ අගය වැඩිවීම සහ රටතුල පැවති විදුලිබල අර්බුදය හේතුවෙන් විදුලි ජනක යන්ත්‍රවල මිල ඉතා විශාල වශයෙන් ඉහල යාම නිසා මිල වැඩිවීම සිදුවී ඇත. | ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (v) | විදුලි ජනන යන්ත්‍රය සවි කිරීම සඳහා දත්ත මධ්‍යස්ථානයේ සර්වර් යන්ත්‍ර අක්‍රිය කර නැවත යථා තත්ත්වයට පත් කිරීම සඳහා පූර්ව අනුමැතියකින් තොරව රු.66,000 ක් බාහිර ආයතනයකට ගෙවා තිබුණි. | කාර්යය අවසන් වීමෙන් පසු බිල්පත ඉදිරිපත් කර තොරතුරු තාක්ෂණ අංශයේ නිර්දේශ මත අනුමැතිය ලබාගෙන ගෙවීම් කර ඇත. | පූර්ව අනුමැතියක් ලබාගෙන ගෙවීම් කළ යුතු වීම. |
| (ඇ) | **විදුලි ජනන යන්ත්‍රය ස්ථාපිත කිරීම සඳහා ආවරණ කුටියක් ඉදිකිරීම** | | |
| (i) | මෙම කොන්ත්‍රාත්තුව සඳහා මිල ගණන් කැඳවා තිබුණේ විදුලි ජනන යන්ත්‍රය මිලදී ගැනීමේ කොන්ත්‍රාත්තුව පිරිනමා මාස 02 ½ ක කාලයක් ගත වීමෙන් පසුව වන අතර කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණේ 2022 වර්ෂයේ ලියාපදිංචි සැපයුම්කරුවකු නොවූ විදුලි ජනන යන්ත්‍රය මිලදී ගෙන තිබූ ආයතනය වෙතට විය. | මේ සඳහා 2022 වර්ෂයේ ලියාපදංචි කොන්ත්‍රාත්කරුවන්ගේ හා මීට පෙර කොමිෂන් සභාවේ ඉදිකිරීමේ කටයුතු සාර්ථකව ඉටුකරන ලද සත්මිණ කන්ට්‍රක්ෂන් සමාගමෙන් හා මෙම විදුලි යන්ත්‍ර මිලදී ගැනීමට යෝජිත වින්සි ඉංජිනියරින් (පුද්) සමාගමෙන් මිල ගණන් කැඳවා ඇති අතර අවම මිල ඉදිරිපත් කර තිබූ වින්සි ඉංජිනියරින් (පුද්) සමාගමට කොන්ත්‍රාත්තුව පවරා ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ii) | මෙම කොන්ත්‍රාත්තුව සඳහා 2022 ඔක්තෝබර් 18 දින මිල ගණන් කැඳවා තිබුණද කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණු ආයතනය 2022 සැප්තැම්බර් 08 දින එනම් මිල ගණන් කැඳවීමටත් පෙර ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. | මුලදී මෙම කොන්ත්‍රාත්තුව යන්ත්‍රය මිලදීගත් සමාගම මඟින් ඉටුකර ගැනීමට අදහස්කලත් පසුව විවෘත මිල ගණන් කැඳවීමට තීරණය කරන ලදි. ඒ අනුව සැපයුම්කරුවන් 08 දෙනෙකුගෙන් මිල ගණන් කැඳවූ අතර ඉදිරිපත් වූ මිල ගණන් දෙකෙන් වඩාත් වාසිදායක මිලගණන් ඉදිරිපත්කළ වින්සි කන්ට්‍රක්ෂන් ආයතනයට කොන්ත්‍රාත්තුව පවරන ලදි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (iii) | රු.795,000ක්වූ කොන්ත්‍රාත් මුදල තාක්ෂණ නිලධාරී විසින් ඉදිරිපත් කරතිබූ ඇස්තමේන්තුවෙන් සියයට 38 කට වඩා වැඩිවී තිබුණි. | ඇස්තමේන්තු සකස් කිරීමෙන් පසු රටේ පැවති අයහපත් තත්ත්වය මත මිල ගණන් සීඝ්‍ර ලෙස වැඩිවීම මත මෙම වැඩිවීම සිදුවී ඇත. | තාත්වික හා නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම |

### 3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුත්තලම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ පවතින ජෙනරේටරය වසර 06 කට අධික කාලයක් තිස්සේ භාවිතයකින් තොරව නිශ්ක්‍රීයව පැවතුණි. | මෙය මේ වනවිට ප්‍රධාන කාර්යාලයේ පවතින අතර අවශ්‍යතාවය මත වෙනත් කාර්යාලයකට ලබාදීමට කටයුතු කර ඇත. | ජෙනරේටරය භාවිතා කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතු වීම. |
| (ආ) | 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ගාල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ අස්ථානගතව තිබූ ජංගම දූරකථනයක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා අලාභ අයකරගෙන නොතිබුණි. | මෙම අස්ථාන ගතවීම සම්බන්ධයෙන් වගකිවයුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ කමිටුවක් පත්කර ඇති අතර අදාල වාර්තාව ලද පසු විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි 104 (1) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | පසුගිය මැතිවරණ කිහිපයක් සඳහා නිසි සැලසුමකින් තොරව මිලදීගෙන තිබූ වටිනාකම රු.12,848,164 ක්වූ විවිධ වර්ගයේ ටෝනර් ,රිබන්, මාස්ටර් රෝල් තීන්ත භාවිතා කිරීමකින් තොරව ගබඩාවේ නිශ්ක්‍රීයව පැවතුණි. | වගකිව යුත්තන් නිශ්වය කිරීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර කමිටු වාර්තාව ලබා ගැනීමෙන් පසු ඉදිරි කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමි. | මුදල් රෙගුලාසි 104 (1) ප්‍රකාරව කටයුතු කර වගකිව යුත්තන් නිශ්වය කිරීම කඩිනමින් කළ යුතු වීම. |

### 3.3 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුලදී සිදුවී තිබූ වාහන අනතුරු 03 කට අදාලව රු.151,192 ක් වර්ෂය තුලදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම 2019, 2020 හා 2021 වර්ෂවලදී සිදු වී තිබූ අනතුරුවලින් තවදුරටත් අයකර ගැනීමට නොහැකි වූ හා පොත්වලින් කපා හැරීමට නොහැකි වූ හානි වල වටිනාකම රු.2,598,736 ක් විය. | සමාලෝචිත වර්ෂය තුළ සිදුවූ වාහන අනතුරුවලින් වාහන 03 ක තක්සේරු කරන ලද අලාභයෙන් රු.151,192.00 ක් අයකර ගැනීමට ඇත. 2019, 2020 හා 2021 වර්ෂවල සිදුවූ අනතුරුවලින් පොත්වලින් කපා හැරීමට නියෝග ලැබී ඇති අලාභයන් පොත්වලින් කපා හැරීමට කටයුතු කරමි. | වාහන අනතුරු සම්බන්ධයෙන් වූ හානිවල වටිනාකම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | හානි පාඩු ලේඛණය අනුව 2022 දෙසැම්බර් 31 දිනට කපා නොහළ ඉදිරියට ගෙන යන රු.2,671,428 ක්වූ ශේෂය පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශයේ ඇමුණුම ii හි දක්වා නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | කපා නොහළ ඉදිරියට ගෙන යන ශේෂය පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශයේ ඇමුණුම ii හි දැක්විය යුතු වීම. |

**3.4 කළමනාකරණ දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 ජූලි මාසයේදී යුද හමුදා සේවා සඳහා නිදහස් කර තිබූ නිලධාරීයෙකුගෙන් තවදුරටත් අයවිය යුතු රු.97,110 ක්වූ ණය ශේෂය හා 2021 මැයි මාසයේ විශ්‍රාම ගිය නිලධාරීයෙකුගේ අයවිය යුතු රු.129,080 ක්වූ ණය ශේෂය 2022 වර්ෂය තුලදීද අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | යුද හමුදා සේවා සඳහා නිදහස් කර තිබූ නිලධාරියා විසින් අවසාන වශයෙන් 2022.12.02 දින රු.10,000 ක මුදලක් පියවූ අතර 2021 මැයි මස විශ්‍රාම ගොස් ඇති නිලධාරියාගේ විශ්‍රාම ගොනුව මෙතෙක් සම්පූර්ණ කර නොමැති බැවින් ණය ශේෂය අයකර ගැනිමට නොහැකි වී ඇත. | ණය ශේෂ කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**4. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 06 ක්, තෘතීයික මට්ටමේ තනතුරු 09 ක්, ද්විතීයික මට්ටමේ තනතුරු 42 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 29 ක පුරප්පාඩු පැවතුනි. | පුරප්පාඩු සඳහා නිලධාරීන් ලබාදෙන ලෙස අදාල අංශ දැනුවත් කර ඇති අතර කඩිනමින් පුරප්පාඩු පිරවීමට කටයුතු කරමි. | කාර්යසාධනයට අහිතකර ලෙස බලපාන අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. |